# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ 1993 ඔක්තෝබර් මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 ඔක්තෝබර් මස 22 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

මිළ : රු. 2.55 ශ.　　තැපැල් ගාස්තුව : රු. 3.10 ශ.

# 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1993 ඔක්තෝබර් මස 21 වන දින]

එල්. ඩී.—ඕ. 80/90

**මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම, විධිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියක් පිහිටුවීම සඳහා ද එම සංවර්ධනය ඇති කිරීම පිණිස ආයතන පිහිටුවීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද 1971 අංක 13 දරන රාජ්‍ය මැණික් සංස්ථා පනත ඉවත් කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

පූර්විකාව.

අධිකාරියක් පිහිටුවීම මගින්, මැණික් පතල් කැනීම සහ මැණික් කර්මාන්තය විධිමත් කිරීම සහ මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම මහජන හිත පිණිස යෝග්‍ය වන බැවින් :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය. හා ක්‍රියාත්මක වීමේ දිනය.

1. (1) මේ පනත 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) (අ) මේ වගන්තියේ විධිවිධාන, 55 වන හා 56 වන වගන්තිය සහ මේ පනතේ III වන කොටස මේ පනත පනවනු ලබන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

(ආ) (55 වන හා 56 වන වගන්තිවල විධිවිධාන හැර) I, II සහ IV වන කොටස්වල විධිවිධාන අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින්මතු “නියමිත දිනය” යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

## 1 වන කොටස

## ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පිහිටුවීම

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පිහිටුවීම.

2. (1) (මේ පනතේ “අධිකාරිය” යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය, (1) වන උපවගන්තියෙන් ඊට දෙනු ලැබූ නාමයෙන් සංස්ථාවක් විය යුතු ය. තවද ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, එම නාමයෙන් එය විසින් ද ඊට විරුද්ධ ව ද නඩු පවරනු ලැබිය හැකි ය.

අධිකාරියේ සංයුතිය.

3. අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සභාපතිවරයාගෙන් සහ පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත, (මේ කොටසේ මින්මතු “මණ්ඩලය” යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරනු ලැබිය යුතු ය :—

(අ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ යම් ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

2—ඩී 021960—6,080 (93/03)

(ආ) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත මගින් පිහිටුවනු ලද අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා ;

(ඇ) මුදල් මණ්ඩලය විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(ඈ) මැණික් වෙළෙඳ බැංකුවේ සභාපතිවරයා ;

(ඉ) මේ පනත යටතේ පිහිටුවනු ලද ආයතනවල සභාපතිවරු ;

(ඊ) රේගු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, එම දෙපාර්තමේන්තුවේ යම් ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(උ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(ඌ) ඛනිජ විද්‍යාව, භූ විද්‍යාව, පතල් කැණීම, මැණික් කැපීම හෝ මැණික් හා ස්වර්ණාභරණ නිෂ්පාදනය, විකිණීම සහ අපනයනය සම්බන්ධ කටයුතුවල පුළුල් පළපුරුද්දක්, හැකියාවක් සහ පිළිගැනීමක් ඇති බවට අමාත්‍යවරයාට පෙනියන්නා වූ සහ අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන්නා වූ (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් සාමාජිකයන් පස් දෙනෙක්.

සාමාජිකත්වයට නුසුදුස්සකු වීම.

4. යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සාමාජිකයෙකු වේ නම් හෝ එවැනි මන්ත්‍රීවරයකු හෝ සාමාජිකයකු බවට පත්වන්නේ නම් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් වේ නම් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්වන යම් නීතියක් යටතේ සිහි විකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ සිටී නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ සිටී නම් ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් නියම කරන ලද සිර දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත් නම් ; හෝ

(ඉ) අධිකාරිය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් ඇති කරන ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරයි නම් හෝ භුක්ති විඳියි නම් ; හෝ

(ඊ) මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තම කර්තව්‍ය තමා විසින් ඉටු කිරීමේදී ඊට හානිකර අන්දමින් බලපෑමට ඉඩ ඇති යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් දරයි නම්

එම තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස දිගටම කටයුතු කර ගෙන යාමට හෝ නුසුදුස්සෙක් වන්නේ ය.

පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය.

5. සෑම පත්කළ සාමාජිකයකු ම, මරණය, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා කලින් ධුරය හිස් කළහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

පත් කළ සාමාජිකයන් ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම.

6. (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් යම් පත් කළ සාමාජිකයකු යම් හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ නියමයක් කරනු ලැබුවේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ද ඒ සාමාජිකයා, එම නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි ධුරය හිස් කළ ලෙස සළකනු ලැබිය යුතු ය.

(2) යම් පත්කළ සාමාජිකයකු මරණය, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා ධුරය හිස් කළ අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, 3 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඒ සාමාජිකයාට අනුප්‍රාප්තවීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එසේ පත්කරනු ලබන යම් සාමාජිකයෙක්, තමා අනුප්‍රාප්තිකයා වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ගත නොවූ කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(3) යම් පත් කළ සාමාජිකයකු විසින්, තමා ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත යොමු කරන ලද ලියාපදිංචි තැපෑලෙන් යවන ලද ලිපියක් මගින්, කවර හෝ අවස්ථාවකදී, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) රෝගාතුරවීම, අබලතාව හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා තම ධුරයෙහි කාර්ය ඉටු කිරීමට මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුට තාවකාලික ව නොහැකි වන අවස්ථාවක, එසේ නොහැකිවීම ගැන අමාත්‍යවරයාට ලියවිල්ලකින් දැන්වීම එම සාමාජිකයාගේ යුතුකම වන්නේ ය. ඉන්පසු ඔහු වෙනුවට වැඩබැලීම සඳහා අමාත්‍යවරයා විසින් 3 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

7. අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් අධිකාරියේ අරමුදලින් මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ සභාපතිවරයා.

8. (1) මණ්ඩලයේ සභාපතිවරයා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා සභාපතිවරයාට ස්වකීය ධුරයේ කටයුතු කරගෙන යාමට තාවකාලික ව නොහැකි වුවහොත් ඔහු වෙනුවෙන් වැඩබැලීම සඳහා වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් හේතු දක්වා සභාපතිවරයාගේ පත්වීම අවසාන කළ හැකි ය.

(4) සභාපතිවරයා විසින් අමාත්‍යවරයා වෙත යොමු කළ ලිපියක් මගින් සභාපති ධුරයෙන් කවර හෝ අවස්ථාවක දී ඉල්ලා අස්විය හැකි ය. ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මගින් භාර ගත් විට එම ඉල්ලා අස්වීම ක්‍රියාත්මක විය යුතු ය.

(5) (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය.

(6) සභාපතිවරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, මණ්ඩලයේ මෙහෙයවීමට හා පාලනයට යටත්ව, අධිකාරියේ කටයුතු පිළිබඳ පරිපාලනය හා කළමනාකරණය ඔහුට භාර විය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම්.

9. (1) සභාපතිවරයා පැමිණ සිටී නම්, ඔහු මණ්ඩලයේ සෑම රැස්වීමකම මූලසුන දැරිය යුතුය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරින් කෙනෙකු ඒ රැස්වීමේ මූලසුන දැරීම සඳහා තෝරා පත් කර ගත යුතුය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් හත් දෙනෙකු විය යුතු ය.

(3) සභාපතිවරයාට හෝ මණ්ඩලයේ යම් රැස්වීමක මූලසුන දරන සාමාජිකයාට තමාගේ ඡන්දයට අතිරේකව, තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධානවලට යටත් ව, මණ්ඩලය විසින් මණ්ඩලයේ රැස්වීම් සහ එම රැස්වීම්වලදී කටයුතු කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් ක්‍රියාවක් අවලංගු නොවන බව.

10. මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් හෝ යම් සාමාජිකයෙකුගේ පත්වීම පිළිබඳ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා ම, මණ්ඩලයේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කෘත්‍යයක් අවලංගු වන ලෙස නොසැලකිය යුතු ය.

අධිකාරියේ මුද්‍රාව.

11. (1) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කර සකස් කළ හැකි අතර එය, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාර යට වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරියේ මුද්‍රාව, මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය.

(3) අධිකාරියේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තැබීම මණ්ඩලයේ අනුමැතිය ඇතිව සහ තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු සභාපතිවරයා සහ එක් සාමාජිකයෙකු ඉදිරියේදී හැර, නොකළ යුතු ය.

(4) අධිකාරියේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් මණ්ඩලය විසින් තබාගත යුතු ය.

අධිකාරිය විසින් ස්වකීය බලතල අමාත්‍යවරයාගේ විධාන යටතේ ක්‍රියාත්මක කළ යුතු බව.

12. ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී හා කර්තව්‍ය ඉටුකිරීමේදී අධිකාරිය මැණික් කර්මාන්තය හා ස්වර්ණාභරණ කර්මාන්තය පිළිබඳ ආණ්ඩුවේ සාමාන්‍ය ප්‍රතිපත්තියට ද ඒ ප්‍රතිපත්තියට අදාළව අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන යම් සාමාන්‍ය හෝ විශේෂ විධානවලට ද අනුකූලව ක්‍රියා කළ යුතු ය.

මණ්ඩලයේ බලතල හා කර්තව්‍ය පැවරීම.

13. (1) මණ්ඩලය විසින් එහි බලතල හා කර්තව්‍ය අතුරින් යමක් සභාපතිවරයාට පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකාරියේ බලතල හා කර්තව්‍ය අතුරින් යමක් පැවරුණු සභාපතිවරයා විසින්, එසේ පැවරුණු බලතල හා කර්තව්‍ය, මණ්ඩලයේ විශේෂ හෝ සාමාන්‍ය විධානවලට අනුකූලව ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

අධිකාරියේ බලතල සහ අධිකාරිය

14. (1) අධිකාරියේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය :—

(අ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම;

(ආ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා යෝජනා ක්‍රම ආරම්භ කර ක්‍රියාත්මක කිරීම;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත හෝ මැණික් සහ ස්වර්ණාභරණ සඳහා වූ වෙළඳ පොළ ප්‍රයෝජනයට ගැනීම සහ ඒ මැණික් සහ ස්වර්ණාභරණ සඳහා ලෝක වෙළෙඳ පොළවල ඉල්ලුම් ප්‍රවර්ධනය කිරීම;

(ඈ) මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය දියුණු කිරීමේ අදහසින් එම කර්මාන්තවලට අදාළ සෑම අංශයකම සේවක පිරිස්වලට කාර්මික පුහුණුව, විශේෂයෙන් තාප යෝජනය සහ මැණික් කැපීම පිළිබඳව පුහුණුව ප්‍රවර්ධනය කිරීම සහ ඊට අනුග්‍රහ දැක්වීම;

(ඉ) අනාගත ගැණුම්කරුවන් තුළ මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය කෙරෙහි විශ්වාසය ඇති කිරීමට අවශ්‍ය විය හැකි පියවර ගැනීම;

(ඊ) නීති විරෝධී මැණික් ගැරීම සහ නීති විරෝධී ලෙස මැණික් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම වැළැක්වීම;

(ඩ) පතල් කැනීමේ හෝ මැණික් ගැරීමේ අයිතිවාසිකම යම් ආරක්ෂා කිරීමක හේතුවෙන් හෝ අන්‍යාකාරයෙන් රජය වෙත රැඳී ඇති අවස්ථාවල රජයේ ඉඩම්වල හෝ ඒ මත හෝ රජය විසින් හෝ රාජ්‍ය මැණික් සංස්ථාව විසින් බැහැර කරන ලද ඉඩම්වල හෝ ඒ මත මැණික් සඳහා පතල් කැණීමේ අයිතිවාසිකම අන්සතු කරදීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව වගකිවයුතු එකම බලධරයා වශයෙන් ක්‍රියා කිරීම :

එසේ වුවද එවැනි සෑම අන්සතු කිරීමක්ම ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ සහ පරිසර විෂයය භාර අමාත්‍යවර යාගේ එකඟත්වය ඇතිව විය යුතු අතර, ඒ අයිතිවාසිකම හා සම්බන්ධ ඉඩම මහවැලි අධිකාරිය සන්තකයේ තිබෙන අවස්ථාවක, මහවැලි සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව විය යුතු ය;

එසේම තවදුරටත් යම් අන්සතු කිරීමක් පිළිබඳව අමාත්‍යවරයන් අතර එකඟ නොවීමක් පවත්නා අවස්ථාවක, එම කාරණය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කළ යුතු අතර, ඉන් පසුව ඒ අන්සතු කිරීම්, අමාත්‍ය මණ්ඩල යේ එකඟත්වය ඇතිව විය යුතු ය.

(ඬ) මැණික් සහ ස්වර්ණාභරණ අලෙවි කිරීමට අවශ්‍ය කාර්මික සහ වෙනත් උපදෙස් සහ උපව්‍යුහාත්මක ආධාර සැපයීම ;

(ණ) යම් උපලේඛනගත ලිඛිත නීතියක්—

(i) එය මැණික් හෝ මැණික් කර්මාන්තය සම්බන්ධ යෙන් අදාළ වන තාක් දුරට; හෝ

(ii) මේ පනත යටතේ අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්ය අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වනතාක් දුරට,

එම නීතියේ කාර්ය පරිපාලනය කිරීම ;

(ත) මැණික් සහතික කිරීම සඳහා සහ වටිනා ලෝහ වර්ග පිළි බඳ ලෝහ පරීක්ෂාව සඳහා කාර්යාල පිහිටුවීම;

(ථ) ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ස්වර්ණාභරණ නිෂ්පාදිතයකුගේ ඉල්ලීම පිට, නියමිත ආකාරයකට විශේෂ ලකුණකින් මුද්‍රා තබන බවට වගබලා ගැනීම ;

(ද) මැණික් කර්මාන්තයේ සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදී සිටින තැනැත්තන්ගෙන් මැණික් කර්මාන්තයට හෝ ස්වර්ණාභරණ කර්මාන්තයට අදාළ යම් කාරණයක් පිළිබඳ සංඛ්‍යා ලේඛන එකතු කිරීම සහ අධිකාරියේ අභි මතය පරිදි එම සංඛ්‍යා ලේඛන පළ කිරීම ;

(ක) ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තයේ සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ සංවර්ධනය ඇති කිරීම හා සම්බන්ධී කරණය කිරීම සඳහා මැණික් කර්මාන්තය, ස්වර්ණාභරණ කර්මාන්තය සහ ආණ්ඩුවේ දෙපාර්තමේන්තු අතර අවශ්‍ය සහයෝගය ලබාදීම ;

(ග) මැණික් කර්මාන්තයේ සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ වැඩ කරන තැනැත්තන්ගේ සේවා නියුක්ති නියමයන් සහ කොන්දේසි, විශේෂයෙන් එම තැනැත්තන්ගේ ජීවිත සහ ශරීරාංග අනතුරුවලින් ආරක්ෂා කිරීම සඳහා ගත යුතු ආරක්ෂක පියවර විධිමත් කිරීම සහ පාලනය කිරීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා අධිකාරියට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත් කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔබ පණය කිරීම, විකිණීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම ;

(ආ) කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන නියමයන් සහ කොන්දේසි මත ණය මුදල් ලබා ගැනීම ;

(ඇ) මුදලින් හෝ වෙනත් ආකාරයකින් වූ ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීම සහ ඒවා අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා යෙදීම ;

(ඈ) අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කිරීම ;

(ඉ) අධිකාරියේ කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය වෙනත් නිලධර යන් සහ සේවකයන් පත් කිරීම ;

(ඊ) එසේ පත්කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කිරීම ;

(උ) අධිකාරියේ අරමුදලින් ඒ පාරිශ්‍රමික ගෙවීම ;

(ඌ) මේ පනත යටතේ වූ යම් වරදක් කිරීම පිළිබඳව අනාවරණය කර ගැනීමට තුඩුදෙන තොරතුරු සපයන හෝ යම් වැටලී මකට සහාය වන—

(i) යම් තැනැත්තකුට ;

(ii) රජයේ නිලධරයකුට හෝ අධිකාරියේ සේවා නියුක්ත යකුට

අධිකාරියේ අරමුදලින්, නියමිත ආකාරයෙන් තෑගි මුදල් ගෙවීම ;

(එ) අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලබන තැනැත් තන් සඳහා අර්ථ සාධක අරමුදලක් සහ සමාජ සංරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ ඔවුන්ට සුභසාධන සහ විනෝද පහසුකම්, නිවාස, නවාතැන් සහ වෙනත් සමාන ඉඩ පහසුකම් සපයා දීම ;

(ඒ) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන ගිවිසුම්වලට ශ්‍රී ලංකාව තුළදී හෝ ඉන් පිටතදී එළඹීම සහ ඒ ගිවිසුම් ඉටු කිරීම;

(ඔ) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම; සහ

(ඕ) සාමාන්‍යයෙන්, අධිකාරියේ කර්තව්‍ය නිසි ලෙස ඉටුකිරීම පහසු කිරීම සඳහා අවශ්‍ය සියලු වෙනත් දේ කිරීම.

අධිකාරිය විසින් බලපත්‍ර නිකුත් කළ යුතු බව.

**15.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇතද මැණික් කර්මාන්තය කරගෙන යනු ලබන්නේ හෝ කිරීමට යෝජනා කරනු ලබන්නේ නම් යම් රජයේ ඉඩමක වේවා, පුද්ගලික ඉඩමක වේවා එම කර්මාන්තය කරගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු එකම බලධරයා අධිකාරිය විය යුතු ය.

(2) අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ හැර කිසිම තැනැත්තකු විසින් මැණික් කර්මාන්තය කරගෙන නොයා යුතු ය.

(3) මැණික් කර්මාන්තය කරගෙන යාම පිළිබඳ බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක්ම නියම කරනු ලබන ආකෘතියෙහි අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) (අ) මැණික් කර්මාන්තය කරගෙන යාම සඳහා මේ පනත යටතේ අධිකාරිය විසින් යම් තැනැත්තකුට බලපත්‍රයක් නිකුත් කිරීම, නියම කරනු ලබන ගාස්තුවක් හෝ ගාස්තු ඒ තැනැත්තා විසින් අධිකාරියට ගෙවීමෙන් පසුව මිස, නොකළ යුතු ය.

(ආ) ඒ සෑම බලපත්‍රයක් ම—

(i) නියමිත ආකෘතියෙහි විය යුතු ය;

(ii) නියම කරනු ලැබිය හැකි නියමයන්ට සහ කොන්දේසිවලට යටත් විය යුතු ය;

(iii) කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, එය නිකුත් කරනු ලැබූ දිනයේ සිට මාස දොළහක කාලයක් බලාත්මකව පැවතිය යුතු ය.

(5) යම් කුඹුරක මැණික් සඳහා පතල් කැනීම හෝ මැණික් ගැරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති අවස්ථාවක, ඒ ඉඩමේ වගාකරු ඒ ඉඩමේ අයිතිකරු නොවේ නම් හෝ බලපත්‍රධාරියා නොවේ නම්, ඔහුට බදු කාලසීමාව තුළ ඒ කුඹුරෙහි අහිමි වූ ආදායම වෙනුවෙන් නියම කරනු ලැබිය හැකි ආකාරයකට තක්සේරු කරන ලද මුදල් ප්‍රමාණයක වන්දියක්, ඒ ඉඩමේ ඉඩම් හිමියා විසින් ගෙවනු ලැබිය යුතු ය.

(6) මේ පනත යටතේ යම් තැනැත්තකුට නිකුත් කරනු ලබන කිසිම බලපත්‍රයක් වෙනත් යම් තැනැත්තකුට පැවරිය නොහැකි වන අතර, ඒ අනුව එවැනි යම් පැවරුමක් ශූන්‍ය හා බලරහිත විය යුතු ය.

(7) (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් යටතේ ගෙවිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් හෝ බලපත්‍රයේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසි කිසිවකට අනුකූලව ක්‍රියා කිරීමට බලපත්‍රලාභියා අපොහොසත් වුවහොත් අධිකාරිය විසින් කවර හෝ අවස්ථාවකදී එම බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබිය හැකි ය.

(8) අධිකාරිය විසින්—

(අ) (3) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා කරන ලද ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලබන;

(ආ) (7) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලබන

අවස්ථාවකදී බලපත්‍රලාභියා විසින් අවස්ථාවෝචිත පරිදි එය ප්‍රතික්ෂේප කිරීමේ හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමේ දිනයෙන් දින තිහක කාලයක් ඉකුත් වීමට පෙර (මෙහි මින් මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කළ හැකි ය.

(9) (8) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරනු ලබන යම් අභියාචනයක් මත, ලේකම්වරයා විසින්—

(අ) අභියාචනයට ඉඩදී බලපත්‍රය නිකුත් කිරීමට හෝ අලුත් කිරීමට අධිකාරියට විධාන කළ හැකි ය; නැතහොත්

(ආ) අභියාචනය ප්‍රතික්ෂේප කළ හැකි ය.

(10) (9) වන උපවගන්තිය යටතේ තමන් වෙත නිකුත් කරන ලද යම් විධානයකට අනුකූලව අධිකාරිය විසින් ක්‍රියා කළ යුතු ය.

(11) (8) වන උපවගන්තිය යටතේ ලේකම්වරයා වෙත කරන ලද අභියාචනයක් ප්‍රතික්ෂේප කිරීමට ලේකම්වරයා විසින් (9) වන උපවගන්තිය යටතේ කරන ලද තීරණයකින් අතෘප්ත ඉල්ලුම් කරුවකු හෝ බලපත්‍රලාභියකු විසින්, ලේකම්වරයාගේ ඒ තීරණය ඔහුට දැනුම් දෙනු ලැබූ දින සිට දවස් තිහක් ඇතුළත, ඒ තීරණයට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් කළ හැකි ය.

(12) (11) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන අභියාචනයකට අදාළ කරගත හැකි ශ්‍රේෂ්ඨාධිකරණ රීතිවල විධිවිධාන ඊට අදාළ විය යුතු ය.

(13) ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ අභියාචනයක් මත, ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, (11) වන උපවගන්තිය යටතේ,—

(අ) ඒ අභියාචනයට ඉඩ දී අභියාචනයට විෂය වී ඇති බලපත්‍රය නිකුත් කරන ලෙස හෝ අලුත් කරන ලෙස අධිකාරියට විධාන කළ හැකි ය; නැතහොත්

(ආ) ඒ අභියාචනයට ඉඩ නොදිය හැකි ය.

(14) යම් රජයේ ඉඩමක හෝ පතල් කැණීමේ අයිතිවාසිකම රජයේ වාසියට ඉතිරිකර ගනිමින් සංස්ථාව විසින් බැහැර කරන ලද යම් ඉඩමක හෝ පතල් කැනීමේ හෝ මැණික් ගැරීමේ අයිතිවාසිකමක් සම්බන්ධයෙන් රාජ්‍ය මැණික් සංස්ථාව විසින් දෙන ලද හෝ දෙන ලදැයි සැලකෙන සෑම බද්දක් ම එම බද්ද නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේ වලංගුව පවතී නම්, අධිකාරිය විසින් දෙන ලද බද්දක් ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය:

එසේ වුවද ඒ බද්ද දී තිබුණේ යම් නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව ද ඒ නියමයන් හා කොන්දේසි වෙනස් කිරීම හෝ එම බද්දේ නියමයන්ට සහ කොන්දේසිවලට අතිරේකව වැඩිදුර නියමයන් සහ කොන්දේසි එකතු කිරීම හෝ අධිකාරිය විසින් කළ හැකි ය.

අධිකාරිය විසින් මැණික් අපනයනය අනුමත කළ යුතු බව.

16. අධිකාරියේ අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් මැණික් අපනයනය කිරීම නොකළ යුතු ය.

ස්වර්ණාභරණ කර්මාන්තය කරගෙන යන තැනැත්තන් අධිකාරිය විසින් ලියාපදිංචි කළ යුතු බව.

17. (1) කිසිම තැනැත්තකු විසින් කිසිම ස්ථානයක ස්වර්ණාභරණ කර්මාන්තය කරගෙන යාම අධිකාරිය වෙත ඒ කර්මාන්තය කරගෙන යන ස්ථානය ලියාපදිංචි කර ඇත්නම් මිස නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කුමක් වුවද නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ යම් ස්ථානයක ස්වර්ණාභරණ කර්මාන්තය කරගෙන යමින් සිටි තැනැත්තකු, නියමිත දිනයේ සිට මාස තුනක් ඇතුළත, ඒ ස්ථානය අධිකාරිය වෙත ලියාපදිංචි කළ යුතු ය.

(3) ස්වර්ණාභරණ කර්මාන්තය කරගෙන යන්නා වූ සහ අධිකාරියෙන් යම් සහනයක් ලබා ගැනීමට බලාපොරොත්තු වන සෑම අයදුම්කරුවකු ම ඒ කර්මාන්තය අධිකාරියෙහි ලියාපදිංචි කළ යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "ස්ථානය" යන්නෙන් ස්වර්ණාභරණ වෙළෙඳාම හෝ ව්‍යාපාරය කරගෙන යන්නා වූ ද ඒ වෙළෙඳාම හෝ ව්‍යාපාරය එසේ කරගෙන යාම සම්බන්ධයෙන් මහ නගර සභා ආඥාපනත යටතේ හෝ නගර සභා ආඥාපනත යටතේ හෝ බද්දක් අයකරනු ලබන්නා වූ ද ස්ථානයක් අදහස් වේ.

ලැබෙන මැණික් වෙනුවට රාජ්‍ය භාගය ගෙවිය යුතු බව.

18. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව රජයේ ඉඩමක හෝ පතල් කැනීමේ හෝ මැණික් ගැරීමේ අයිතිවාසිකම රජය වෙත පවත්නා යම් ඉඩමක යම් තැනැත්තකු මැණික්

පතල් කණින්නාවූ ද, ඒ ඉඩම සහ ඒ පතල් කැණීමේ සහ මැණික් ගැරීමේ අයිතිවාසිකම් ඒ තැනැත්තා විසින් වෙන්දේසියකින් අත්කරගෙන ඇත්තාවූ ද අවස්ථාවක ඒ තැනැත්තා විසින් ඒ වෙන්දේසියේදී ගෙවන ලද මිලෙහි, ඒ ඉඩමෙන් ලැබෙන යම් මැණික් වෙනුවට රාජ්‍ය භාගයක් ද ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කුමක් වුවද රජයේ ඉඩමක හෝ පතල් කැණීමේ හෝ මැණික් ගැරීමේ අයිතිවාසිකම් රජය වෙත පවත්නා යම් ඉඩමක හෝ යම් තැනැත්තකු විසින් මැණික් පතල් කණින්නා වූ ද, ඒ ඉඩම හෝ ඒ පතල් කැණීමේ සහ මැණික් ගැරීමේ අයිතිවාසිකම් ඒ තැනැත්තා විසින් වෙන්දේසියකින් නොව වෙනත් ආකාරයකින් අත්කර ගෙන ඇත්තාවූද අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ ඉඩමෙන් ලබාගන්නා යම් මැණික්, අධිකාරියට භාරදිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ යම් මැණිකක් අධිකාරියට භාර දෙනු ලැබූ අවස්ථාවක අධිකාරිය විසින්—

(අ) බලපත්‍රලාභියාගේ කැමැත්ත ඇතිව ඒ මැණික වෙනත් යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට විකිණීමට සැලැස්විය හැකි ය; නැතහොත්

(ආ) ඒ මැණික විකිණීමට සැලැස්වීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

(4) (2)වන උපවගන්තිය යටතේ අධිකාරියට භාරදෙන ලද යම් මැණිකක් අධිකාරිය විසින් කටයුතු සැලැස්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෙනත් තැනැත්තකුට විකුණන ලද අවස්ථාවක එම විකිණීමෙන් ලැබෙන මුදලින් නියමිත ප්‍රංශුවක් අධිකාරිය විසින් එකී රාජ්‍ය භාගය වශයෙන් තබාගත යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ අධිකාරියට භාරදෙන ලද යම් මැණිකක් විකිණීමට සැලැස්වීම අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, අධිකාරිය විසින් මැණික, අධිකාරියට භාර දුන් තැනැත්තා වෙත ඒ මැණික විකිණීමට සැලැස්වීම අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කර ඇති බව ප්‍රකාශ කෙරෙන ලේඛනයක්ද සමග භාරදිය යුතු ය. එහෙත් අධිකාරිය විසින් තීරණය කරනු ලබන පරිදි වූ ඒ මැණිකේ වෙළෙඳපළ වටිනාකමින් නියමිත ප්‍රංශුවක් රාජ්‍ය භාගය වශයෙන් අයකරගත යුතු ය.

(6) කිසිම තැනැත්තකු (2) වන උපවගන්තියේ සඳහන් යම් ඉඩමක පතල් කැණීමෙන් වෙනත් තැනැත්තකුට ලැබුණු යම් මැණිකක් එකී වෙනත් තැනැත්තාගෙන් මිලට ගැනීම, එම මැණික විකිණීමට සැලැස්වීම අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කර ඇත්නම් මිස, නොකළ යුතු ය.

## II වන කොටස

### අධිකාරියේ මුදල් සහ කාර්ය මණ්ඩලය

අධිකාරියේ ප්‍රාග්ධනය.

19. (1) අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් කෝටි පහලොවක් විය යුතු අතර එය පහත දැක්වෙන මුදල් ප්‍රමාණවලින් සමන්විත විය යුතු ය :—

(i) රාජ්‍ය මැණික් සංස්ථාවේ බැරට ඇත්තා වූ ද නියමිත දිනයේ සිට අධිකාරියට පවරනු ලබන්නා වූ ද සියලු මුදල් ප්‍රමාණ යන් ;

(ii) ඒකාබද්ධ අරමුදලින් අධිකාරියට ලබාදෙන මුදල් ප්‍රමාණය.

(2) අධිකාරියේ ප්‍රාග්ධනය අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයකින් කලින් කල වැඩි කරනු ලැබිය හැකි ය.

අධිකාරියේ අරමුදල.

20. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ ම අරමුදලක් අධිකාරියට තිබිය යුතු ය.

(2) අරමුදලට පහත දැක්වෙන මුදල් ප්‍රමාණයන් ගෙවනු ලැබිය යුතු ය :—

(අ) ඒකාබද්ධ අරමුදලින් අධිකාරියට ලබාදෙන සියලු මුදල් ;

(ආ) රාජ්‍ය මැණික් සංස්ථාවේ බැරට ඇත්තා වූ ද නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි අධිකාරිය වෙත පැවරෙන්නාවූ ද සියලු මුදල් ;

(ඇ) අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල් ; සහ

(ඈ) පරිත්‍යාග වශයෙන් අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල්.

(3) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී අධිකාරියට දරන්නට සිදුවන වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සහ අරමුදලින් ගෙවිය යුතු යයි මේ පනතින් නියමිත සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

21. (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම පිළිබඳ වූ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අධිකාරියේ මුදල් ආයෝජනය කිරීම.

22. අධිකාරිය සතු කවර හෝ මුදලක්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට, මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

*අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා*

23. (1) අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ ලිඛිත අනුමතය ඇතිව, අධිකාරිය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑම අවස්ථාවකම, අධිකාරියේ විධානය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) අධිකාරිය විසින්, අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයක්, අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවනු ලැබිය යුතු ය.

*අධිකාරියේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.*

24. (1) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, අධිකාරියේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, අධිකාරිය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත්ව ඇති යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයෙහි යොදවා ගනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරියට සේවය කරනු ලබන යම් කාලසීමාවක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවය ලෙස සලකනු ලැබිය යුතු ය.

## III වන කොටස

## ආයතන පිහිටුවීම

*ආයතන පිහිටුවීම සඳහා සංස්ථාගත කිරීමේ නියමයන්.*

25. (1) මැණික් කර්මාන්තය හෝ ස්වර්ණාභරණ කර්මාන්තය හෝ වැඩි දියුණු කිරීමෙහිලා සහායවීමේ කාර්යය සඳහා ආයතනයක් පිහිටුවීම අවශ්‍ය බව අමාත්‍යවරයා සලකන අවස්ථාවකදී අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාගත කිරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින්—

(අ) ඒ නියමයෙහි නිශ්චය කොට දැක්වෙන කර්තව්‍ය ඉටු කිරීම සඳහා ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු යයි ප්‍රකාශ කළ හැකි ය ;

(ආ) ඒ ආයතනය සඳහා සංස්ථා නාමයක් දිය හැකි ය ;

(ඇ) ආයතනයේ ආරම්භක ප්‍රාග්ධනය නිශ්චිතව සඳහන් කළ හැකි අතර, ඒකාබද්ධ අරමුදලින් ගෙවිය හැකි මුදල් ප්‍රමාණය ද අධිකාරිය විසින් එහි අරමුදලින් යම් මුදලක් ගෙවිය හැකි නම් ඒ මුදල් ප්‍රමාණයද, මේ කොටස යටතේ පිහිටුවනු ලබන ආයතයක් විසින් ගෙවනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයක් වෙතොත් ඒ මුදල් ප්‍රමාණය ද නිශ්චිතව සඳහන් කළ හැකි ය ;

(ඈ) ආයතනයේ අරමුණු නිශ්චිතව සඳහන් කළ හැකි ය ;

(ඉ) ආයතනයේ බලතල නිශ්චිතව සඳහන් කළ හැකි ය ;

(ඊ) ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව, පහකට වැඩි නොවන සහ තුනකට අඩු නොවන සංඛ්‍යාවක් වන පරිදි, නියම කළ හැකි ය ;

(උ) අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රථම සාමාජිකයන්, මේ කොටසේ විධිවිධානවලට අනුකූලව පත් කළ හැකි ය ;

(ඌ) අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රථම සභාපතිවරයා, මේ කොටසේ විධිවිධානවලට අනුකූලව පත් කළ හැකි ය ;

(එ) අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් සඳහා වූ ගණපූරණය නිශ්චිතව සඳහන් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ විට, ඒ නියමයේ නිශ්චිතව සඳහන් සංස්ථා නාමයෙන් සහ අඛණ්ඩ පැවත්මක් ඇතිව, (මේ කොටසෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයක් පිහිටුවනු ලැබූ බව සැලකිය යුතු ය.

(3) බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් ආයතනය වෙත, අධිකාරිය විසින්, කලින් කල පොදු හෝ විශේෂ විධාන ලියවිල්ලක් මගින් දිය හැකි අතර, ආයතනය විසින් එම විධාන ක්‍රියාවේ යෙදවිය යුතු ය.

අධ්‍යක්ෂ මණ්ඩලය.

26. (1) ආයතනයේ (මේ කොටසෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉන් එක් සාමාජිකයකු විය යුතු ය ; තවද එම සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස නම් කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ සාමාජිකයකු, කලින් ධුරය හිස් කළහොත් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(3) මණ්ඩලයේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම අවශ්‍යතාවෝචිත යැයි අමාත්‍යවරයා අදහස් කරන්නේ නම්, අමාත්‍යවරයා විසින්, හේතු දක්වා, ඒ සාමාජිකයා එසේ ඉවත් කළ හැකි ය.

(4) සාමාජිකයකු විසින්, අමාත්‍යවරයා වෙත යොමු කෙරෙන ලිපියක් මගින්, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් සාමාජිකයකුගේ ධුරය හිස් වූ විට, ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කළ හැකි ය. එසේ පත් කරනු ලබන යම් තැනැත්තකු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ, ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කොටස සඳහා ඒ තැනැත්තා ධුරය දැරිය යුතු ය.

(6) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ තම ධුරයේ කාර්ය ඉටු කිරීමට යම් සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක, ඒ සාමාජිකයා වෙනුවට කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(7) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියමයන් හා කොන්දේසි මත, මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය

(8) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා තම ධුරයේ කාර්ය ඉටු කිරීමට සභාපතිවරයා තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක, සභාපති වශයෙන් කටයුතු කිරීම සඳහා මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(9) මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම සහ ඒ රැස්වීම්වල කටයුතු කිරීම විධිමත් කිරීම පිණිස වූ රීති මණ්ඩලය විසින් මේ පනතේ සහ සංස්ථාගත කිරීමේ නියමයේ විධිවිධානවලට යටත්ව, සෑදිය හැකි ය.

(10) ආයතනය ඇතුළත් වීමට අදහස් කරන යම් ගිවිසුමක් කෙරෙහි සම්බන්ධතාවක් ඇති සාමාජිකයකු විසින් තමාගේ සම්බන්ධතාවේ ස්වභාවය, මණ්ඩලයේ රැස්වීමකදී හෙළිදරව් කළ යුතු ය. එම හෙළිදරව් කිරීම ඒ රැස්වීමේ වාර්තාවෙහි සටහන් කළ යුතු අතර, ඒ ගිවිසුම පිළිබඳව මණ්ඩලය විසින් කරන සාකච්ඡාවකට හෝ තීරණයකට හෝ ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු ය.

(11) මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීම හෝ සාමාජිකයකු පත් කිරීමෙහිලා දෝෂයක් තිබීම හෝ පමණක් හේතුකොට ගෙන මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ තීරණයක් හෝ නිර්බල නොවිය යුතු ය.

5—B 021960 (93/03)

ආයතනයේ මුද්‍රාව.

27. (1) ආයතනයට පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. ඒ මුද්‍රාව මණ්ඩලය භාරයේ තිබිය යුතු ය.

(2) ආයතනයේ මුද්‍රාව තැබීම, මණ්ඩලය තීරණය කරන ආකාරයට කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර මණ්ඩලයේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට හෝ නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඒ දෙදෙනා විසින් ම ඒ සාධන පත්‍රයෙහි හෝ ලේඛනයෙහි අත්සන් කළ යුතු ය.

(4) ආයතනයේ මුද්‍රාව තබන සාධන පත්‍ර හෝ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් මණ්ඩලය විසින් තබාගත යුතු ය.

අමාත්‍යවරයාගේ විධාන.

28. අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ අදහස් විමසා, කලින් කල මණ්ඩලය වෙත පොදු හෝ විශේෂ විධාන, මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් දෙනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාවේ යෙදිය යුතු ය.

මණ්ඩලයේ බලතල සහ කර්තව්‍යය.

29. (1) ආයතනයේ වැඩ හා ව්‍යාපාරික කටයුතු පිළිබඳ පොදු අධීක්ෂණය, විධානය සහ පාලනය මණ්ඩලය සතු වන්නේ ය.

(2) මේ පනතේ මෙ කොටසින් ආයතනය වෙත පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, ආයතනයට, සංස්ථාගත කිරීමේ නියමයෙහි නිශ්චය කොට දැක්වෙන විශේෂ බලතල ඇත්තේ ය.

(3) සංස්ථාගත කිරීමේ නියමයේ දැක්වෙන අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන්නාවූ හෝ හිතකර වන්නා වූ කවර හෝ දෙයක් කිරීමට මණ්ඩලයට බලය ඇති අතර, තත්කාර්යය සඳහා, මණ්ඩලය විසින්—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම හෝ දැරීම හෝ කුලියට හෝ බද්දට ගැනීම සහ එවැනි යම් දේපළක් කුලියට හෝ බද්දට දීම හෝ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැකි ය:

එසේ වුවද ආයතනය වෙත සතුවී ඇති කිසිම නිශ්චල දේපළක්, අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය නොමැති ව නොවිකිණිය යුතු ය;

(ආ) මුදලින් හෝ ද්‍රව්‍ය වශයෙන් හෝ ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග පිළිගත හැකි ය;

(ඇ) ස්වකීය අරමුණු ඉටුකර ගැනීම සඳහා මුදල් ණයට ලබාගත හැකි ය. තවද යම් මුදල් ප්‍රමාණයක් ආපසු ගෙවන බවට ඇපයක් වශයෙන් එහි යම් දේපළක් උකස් කළ හැකිය.

(ඈ). ස්වකීය අරමුණු ඉටුකර ගැනීම සඳහා සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් පත් කළ හැකි ය;

(ඉ) ස්වකීය කර්තව්‍ය ඉටුකිරීම හෝ කාර්ය කිරීම පිණිස අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට ඇතුළත් වී ඒ ගිවිසුම් ඉටුකළ හැකි ය.

(ඊ) ආයතනයේ වැඩ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදිය හැකි ය;

(උ) එයි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටුකිරීමට ප්‍රාසංගික වූ හෝ ආනුෂංගික වූ හෝ ඒ හා සම්බන්ධ හෝ වෙනත් සියලු ක්‍රියාවන් කළ හැකි ය.

ආයතනයේ ප්‍රාග්ධනය.

**30.** ආයතනයේ ප්‍රාග්ධනය, සංස්ථාගත කිරීමේ නියමයේ නිශ්චය කොට දැක්වෙන මුදල් ප්‍රමාණය විය යුතු අතර පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින්, කලින් කල වැඩි කරනු ලැබිය හැකි ය.

ආයතනයේ වගකීම.

**31.** ආයතනයේ වගකීම, ආයතනයේ ප්‍රාග්ධනයට සීමා විය යුතු ය.

ආයතනයේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

**32.** (1) ලිත් වර්ෂය ආයතනයේ මුදල් වර්ෂය විය යුතු ය.

(2) ආයතනයේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව ආයතනය විසින් නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ ඇති විධිවිධාන, ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් පත් කිරීම.

**33.** (1) ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත්කරනු ලබන නිලධරයන්ට, සේවකයන්ට සහ අනුයෝජිතයන්ට, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයෙන් සහ අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, ඔවුන් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(3) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු ආයතනයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, ආයතනය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර ව පත් කරනු ලැබිය හැකි ය.

(4) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිර ව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) නිශ්චිත කාල සීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ගිවිසුමකට ඇතුළත්ව ඇති යම් තැනැත්තකු ආයතනය විසින් සේව යෙහි යොදවා ගනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ආයතන යට සේවය කරනු ලබන යම් කාල සීමාවක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවය ලෙස සලකනු ලැබිය යුතු ය.

රජයේ චංචල හා නිශ්චල දේපාකාරයේ දේපළ ආයතනයට ලබාගත හැකි බව.

34. (1) රජයේ යම් නිශ්චල දේපළක් ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය, ඒ දේපළ රජයේ ඉඩම් ආඥා පනතේ 6 වන වගන්තිය යටතේ විශේෂ ප්‍රදානයක් කළ හැකි හෝ බද්දක් දිය හැකි හෝ කාර්යයක් සේ සැලකිය යුතු අතර, ඒ අනුව ආයතනය වෙත ඒ දේපළ සම්බන්ධයෙන් කෙරෙන විශේෂ ප්‍රදාන යකට හෝ බදු දීමකට හෝ ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) රජයේ යම් චංචල දේපළක් ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් ඒ චංචල දේපළෙහි සන්තකය සහ ප්‍රයෝජනය ආයතනය වෙත පවරා, සතු කර දිය හැකි ය :

එසේ වුව ද රජයේ යම් චංචල දේපළක් කෙරෙහි බලපාන කිසිම නියමයක්, ඒ දේපළෙහි පාලනය දරන අමාත්‍යවරයාගේ එකඟත් වය නොමැතිව, මේ උපවගන්තියේ මීට ඉහතින් වූ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් නොකළ යුතු ය.

ආයතනයේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

35. ආයතනයේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

36. ආයතනයට විරුද්ධ ව පවරන ලද කිසිම නඩුවක දී ආයතනයේ සාමාජිකයකුට විරුද්ධ ව පෞද්ගලික වශයෙන් හෝ ඔහුගේ දේපළට විරුද්ධ ව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

ආයතනයේ සාමාජිකයකුට විරුද්ධව හෝ ඔහුගේ දේපළට විරුද්ධව කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

37. ආයතනය, අල්ලස් පනතේ අර්ථානුකූල ව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

ආයතනය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

38. (1) නියෝග සෑදීමට මේ කොටසින් බලය දී ඇති කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

නියෝග.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ යටතේ එතෙක් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### සාමාන්‍ය විධිවිධාන.

39. අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

40. අධිකාරියේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූල ව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු ය.

අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

රජයේ චංචල හා නිශ්චල යන දෙආකාරයේම දේපල අධිකාරිය වෙත ලබාදිය යුතු බව.

41. (1) රජයේ යම් නිශ්චල දේපලක් අධිකාරියේ කාර්ය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපල පිළිබඳ විශේෂ ප්‍රදානයක් කළ හැකි හෝ බද්දක් දිය හැකි කාර්යයක් ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව අධිකාරිය වෙත ඒ දේපල සම්බන්ධයෙන් කෙරෙන විශේෂ ප්‍රදානයකට හෝ බදු දීමකට ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) රජයේ යම් චංචල දේපලක් අධිකාරියේ කාර්ය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින්, ඒ චංචල දේපලෙහි සන්තකය සහ ප්‍රයෝජනය අධිකාරිය වෙත පවරා සතු කර දිය හැකි ය :

එසේ වුව ද රජයේ යම් චංචල දේපලක් කෙරෙහි බලපාන කිසිම නියමයක්, ඒ දේපලෙහි පාලනය දරන අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, මේ උපවගන්තියේ මීට ඉහතින් වූ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් නොකළ යුතු ය.

ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත යටතේ නිශ්චල දේපල අත්කර ගැනීම.

42. (1) යම් නිශ්චල දේපලක් අධිකාරියේ නිශ්චිත කාර්යයක් සඳහා අත්කර ගැනීම අවශ්‍ය වන්නා වූ ද තත්කාර්යය සඳහා යෝජිත අත්කර ගැනීම අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් අනුමත කරන්නා වූ ද අවස්ථාවක ඒ දේපල පොදු කාර්යයක් සඳහා අවශ්‍ය වන්නේයැයි සැලකිය යුතු අතර, ඒ අනුව එය ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත යටතේ අත්කරගෙන අධිකාරිය වෙත පවරා දෙනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය සඳහා යම් නිශ්චල දේපලක් ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත යටතේ අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක්, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත හෝ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

43. (1) අධිකාරියේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත හෝ කරන ලද නැතහොත් කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියට පමුණුවනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය වෙත ගෙවූ හෝ අධිකාරිය විසින් අයකර ගන්නා ලද හෝ ගාස්තු කිසිවක්, අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත හෝ කරන ලද නැතහොත් කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද වියදම් ඒ සිවිල් නඩුවේ දී හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකරගෙන ඇත්තාම මිස ඒ ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබුවේ යයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ තැනැත්තාට අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

44. අධිකාරියට විරුද්ධව පවරන ලද කිසිම නඩුවක දී අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිම සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලික වශයෙන් හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය. — අධිකාරියේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

45. (1) රීති සෑදීමට මේ පනතින් බලය දෙනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු කරුණු හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන්, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති, අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි ය. — රීති සෑදීමට අධිකාරිය සතු බලය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද කිසිම රීතියක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබ ඒ අනුමතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

46. මැණික් කර්මාන්තය හෝ ස්වර්ණාභරණ කර්මාන්තය කරගෙන යන කිසිම තැනැත්තකු විසින්, මිලදී ගන්නෙකු හෝ මිලදී ගන්නෙකු වීමට ඉඩ ඇති තැනැත්තකු රැවටීමේ හෝ නොමග යැවීමේ හෝ මිලදී ගන්නෙකු හෝ මිලදී ගන්නෙකු වීමට ඉඩ ඇති තැනැත්තකු තුළ යම් මැණිකක හෝ ස්වර්ණාභරණයක හෝ වර්ගය, ගුණාත්මකභාවය, ප්‍රමාණය, විශාලත්වය, බර හෝ වටිනාකම පිළිබඳ වැරදි හැඟීමක් ඇති කිරීමේ හැකියාව හා ප්‍රවණතාව හෝ බලපෑම ඇති යම් නියෝජනයක්, විස්තරයක් හෝ අවස්ථාගත කරුණු යටතේ ඒ මැණික හෝ ස්වර්ණාභරණය විකිණීම හෝ විකිණීම සඳහා අර්පණය කිරීම හෝ නොකළ යුතු ය. — රැවටීම.

47. අධිකාරියේ කර්තව්‍ය ඉටුකර ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි අධිකාරිය සලකන අවස්ථාවක, කවර හෝ නිලධරයකුට, මැණික් කර්මාන්තය හෝ ස්වර්ණාභරණ කර්මාන්තය කරගෙන යන කවර හෝ භූමිභාගයකට, සියලු යුක්ති සහගත වේලාවන්හිදී ඇතුළු වී එය සෝදිසි කිරීමට අධිකාරිය විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබිය හැකි ය. එසේ බලය දෙනු ලැබූ නිලධරයකු මෙහි මින් මතු "බලය ලත් නිලධරයකු" යනුවෙන් සඳහන් කරනු ලැබේ. — භූමිභාගයකට ඇතුළු වී එය පරීක්ෂා කිරීමට යම් නිලධරකුට බලය දීමට අධිකාරියට බලය ඇති බව.

48. (1) කවර හෝ බලයලත් නිලධරයකු විසින්— — පරීක්ෂා කිරීමේ සහ සෝදිසි කිරීමේ බලතල.

(අ) මේ පනතේ විධිවිධාන අනුව කටයුතු කෙරෙන්නේ ද යන වග දැන ගැනීමේ කාර්යය සඳහා, මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ මැණික් කර්මාන්තය කරගෙන යන කවර හෝ ස්ථානයකට ඇතුළුවී එය පරීක්ෂා කළ හැකි ය ;

(ආ) මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරයෙන් තොරව මැණික් කර්මාන්තය කරගෙන යන බව විශ්වාස කිරීමට තමාට හේතු ඇති කවර හෝ ස්ථානයකට ඇතුළුවී එය පරීක්ෂා කළ හැකි ය ;

(ඈ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය වන පරිදි, යම් මැණිකක් ප්‍රවාහනය කරන බව හෝ අපනයනය කරන බව හෝ විශ්වාස කිරීමට හේතු ඇති කවර හෝ වාහනයක් හෝ යාත්‍රාවක් නැවැත්වීම, ඊට ඇතුළුවීම සහ එය පරීක්ෂා කිරීම කළ හැකි ය ;

(ඇ) මේ පනත යටතේ පවත්වාගෙන යන යම් පොත්, ලේඛන හෝ වාර්තා පරීක්ෂා කළ හැකි අතර, ඒවායේ උධෘත හෝ පිටපත් ගත හැකි ය ;

(ඉ) යම් භූමියක, වාහනයක හෝ යාත්‍රාවක වූ යම් තැනැත්තකු තමා වෙත සඟවාගත් මැණික් ඇතිව සිටින බව විශ්වාස කිරීමට හේතු ඇති අවස්ථාවක, ඒ තැනැත්තා සෝදිසි කළ හැකි ය :

එසේ වුවද කාන්තාවක සෝදිසි කිරීම අධිකාරිය විසින් තත් කාර්යය සඳහා යථා පරිදි බලය දෙන ලද කාන්තාවක් විසින් හැර වෙනත් කිසි තැනැත්තකු විසින් නොකළ යුතු ය ;

(ඊ) එවැනි යම් භූමියක හෝ එවැනි යම් වාහනයක නැත හොත් යාත්‍රාවක කවර හෝ තැනැත්තකුගෙන් ප්‍රශ්න කළ හැකි ය.

(2) එවැනි නිලධරයකු වෙත (1) වන උපවගන්තියෙන් පිරිනැමී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීමේදී ඔහුට බාධා කරන හෝ ප්‍රතිරෝධියපාන සෑම තැනැත්තෙක්ම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දහසකට නොඅඩු දඩයකින් හෝ මාස හයකට නොඅඩු කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමෙන් හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකින්ම හෝ දඬුවම් කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

භාණ්ඩ තහනමට ගැනීමේ බලය.

49. (1) මේ පනත යටතේ යම් වරදක් කර ඇති බව හෝ කර ගෙන යන බව විශ්වාස කිරීමට, යම් බලයලත් නිලධරයකුට හේතු ඇති අවස්ථාවක, ඒ බලයලත් නිලධරයා විසින්—

(අ) ඒ වරද කිරීමට යොදා ගන්නා ලැදයි කියන යම් භාණ්ඩයක් නැතහොත් ඒ වරද යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් කරන ලදැයි කියනු ලැබේද ඒ භාණ්ඩය හෝ අවශ්‍ය කාලයක් තුළ ;

(ආ) මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව නඩු පැවරීම සඳහා ඔහුගේ මතය අනුව අවශ්‍ය වන හෝ ප්‍රයෝජනවත් වන යම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක්

තහනමට ගෙන රඳවා තබා ගත හැකි ය.

(2) යම් බලයලත් නිලධරයකු විසින් යම් භාණ්ඩයක් (1) වන උපවගන්තිය යටතේ තහනමට ගන්නා අවස්ථාවක, මෙහි මින් ඉදිරියට විධිවිධාන සලස්වා ඇති පරිදි එය බැහැර කරනු ලබන තෙක් එය අධිකාරිය භාරයේ සහ එහි පාලනය යටතේ තබා ගත යුතු ය.

50. (1) තහනමට ගන්නා ලද යම් භාණ්ඩයක්, මේ පනත යටතේ වූ වරදක් කිරීම සඳහා හෝ වරදක් කිරීම සම්බන්ධයෙන් හෝ යොදාගන්නා ලද බවට, බලය ලත් නිලධරයකු යථා පරිදි පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු සෑහීමට පත් වන අවස්ථාවක, ඒ භාණ්ඩය රජය වෙත සතු වන්නේ ය. තහනමට ගන්නා ලද භාණ්ඩ පිළිබඳ කාර්ය පටිපාටිය.

(2) බලයලත් නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ යම් භාණ්ඩයක් තහනමට ගැනීමෙන් සහ එය රජය වෙත සතුවීමෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, එය එසේ රජය වෙත සතු වූ දිනයෙන් පසු දවස් හැටක් ඇතුළත, එය එසේ තහනමට ගැනීමට සහ රජය සතුවීමට විරුද්ධව, ඒ තහනමට ගැනීම සහ රජය සතුවීම සිදුවූයේ යම් දිසා අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමා ඇතුළත ද ඒ දිසා අධිකරණය වෙත, ලියවිල්ල කින් වූ ඉල්ලීමක් කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ දිසා අධිකරණය වෙත කරන ඉල්ලීම ලියවිල්ලකින් විය යුතු අතර එය සිවිල් නඩුකරයක පැමිණිල්ලක ආකාරයෙන් විය යුතු ය. එම ඉල්ලීමෙහි, ඒ තැනැත්තා පැමිණිලිකරු ලෙස විස්තර කරනු ලැබිය යුතු අතර, බලයලත් නිලධරයා විත්තිකරු ලෙස විස්තර කරනු ලැබිය යුතු ය. එම ඉල්ලීමෙහි පහත සඳහන් කරුණු එනම්—

(අ) දිසා අධිකරණයේ නම සහ අධිකරණය වෙත ඉල්ලීම ඉදිරිපත් කරන දිනය;

(ආ) බලයලත් නිලධරයාගේ නම සහ ලිපිනය;

(ඇ) අධිකරණය විසින් නිශ්චය කළ යුතු කාරණය එනම් ඉල්ලීමේ විෂය වස්තුව වන භාණ්ඩය තහනමට ගැනීම සහ එය රජය සතු වීම නීති විරෝධී බව පිළිබඳ සරල හා සංක්ෂිප්ත ප්‍රකාශයක් සහ—

(i) ඒ තහනමට ගැනීම හා රජය සතුවීම නීති විරෝධී බව;

(ii) ඒ භාණ්ඩය අප්‍රමාදව පැමිණිලිකරුට ආපසු ලබා දිය යුතු බව

අධිකරණය විසින් තීරණය කරන මෙන් ඉල්ලීමක් ඇතුළත් විය යුතු ය.

(4) යම් භාණ්ඩයක් තහනමට ගැනීම සහ රජය සතු වීම සම්බන්ධයෙන් යම් දිසා අධිකරණයක් වෙත ඉදිරිපත් කර ඇති ඉල්ලීමක් පිළිබඳ යම් නඩු කටයුත්තක දී එකී උපවගන්තිය යටතේ ඒ තහනමට ගැනීම සහ රජය සතු වීම නීති විරෝධී බව ඔප්පු කිරීමේ භාරය පැමිණිලිකරු සතු වන්නේ ය.

(5) (1) වන උපවගන්තිය යටතේ යම් භාණ්ඩයක් රජය සතු වී ඇති සහ—

(අ) යම් බලයලත් නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ ඒ භාණ්ඩය තහනමට ගැනීමට විරුද්ධව (2) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් ඒ උපවගන්තියේ නිශ්චය කොට දැක්වෙන කාලසීමාව ඇතුළත යම් දිසා අධිකරණයක් වෙත ඉදිරිපත් කර නැත්තා වූ; හෝ

(ආ) ඒ උපවගන්තිය යටතේ කරන ලද යම් ඉල්ලීමක් දිසා අධිකරණය විසින් නිෂ්ප්‍රභ කර ඇත්තා වූ සහ ඒ නිෂ්ප්‍රභ කිරීමට විරුද්ධව අභියාචනයක් කිරීමට අවසර දී ඇති කාලසීමාව ඇතුළත අභියාචනයක් කර නැත්තා වූ; හෝ

(ඇ) ඒ උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් නිෂ්ප්‍රභ කිරීමට විරුද්ධව අභියාචනයක් කරන ලදුව ඒ අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබුවා වූ

අවස්ථාවක, අධිකාරිය විසින්, ඒ භාණ්ඩය සන්තකයට ගෙන සුදුසු යයි අධිකාරිය කල්පනා කරන පරිදි එය විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ කළ හැකි ය.

(6) මේ වගන්තියේ සහ 49 වන වගන්තියේ කාර්ය සඳහා "භාණ්ඩයක්" යන්නෙන්—

(අ) යම් මැණිකක් හෝ ස්වර්ණාභරණයක් ;

(ආ) යම් මුදලක් ;

(ඇ) මැණික් කර්මාන්තය හෝ ස්වර්ණාභරණ කර්මාන්තය කරගෙන යාම සඳහා යොදා ගන්නා හෝ යොදා ගත හැකි යම් දෙයක්

අදහස් වේ.

වැරදි. 51. (1) (අ) මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද නියෝගයක හෝ රීතියක විධිවිධාන උල්ලංඝනය කරන ;

(ආ) අධිකාරියේ සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු වී සිටිමින් මේ පනත යටතේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ කාර්ය ඉටු කිරීමේ දී නැතහොත් ඒ හා සම්බන්ධව තමා විසින් ලබා

ගන්නා ලද යම් තොරතුරක් තමා විසින් ඒ තොරතුරු හෙළිදරව් කිරීමට මේ පනතින් බලයදී ඇති කාර්යයක් නොවන යම් කාර්යයක් සඳහා යම් තැනැත්තකුට හෙළිදරව් කරන ;

(ඈ) අධිකාරිය විසින් හෝ අධිකාරියේ අනුමතිය ඇතිව යොදන ලද තථ්‍යචිහ්නයක් බව විශ්වාස කරවීමේ චේතනාවෙන්, ස්වර්ණාභරණයක කවර හෝ ලකුණක් යොදන,

සෑම තැනැත්තෙක්ම මේ පනත යටතේ වූ වරදක් කරන්නේ ය.

(2) මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකු ම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස ලක්ෂයක් නොඉක්මවන දඩයකින් හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමෙන් හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකින්ම හෝ දඬුවම් කරනු ලැබීමට යටත් විය යුතු ය.

(3) මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු ම ද,

(ආ) ඒ පුද්ගල මණ්ඩලය, හවුල් ව්‍යාපාරයක් නම් ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම ද,

ඒ වරදට වරදකරුවකු ලෙස සැලකිය යුතු ය :

එසේ වුව ද ඒ වරද කරන ලද්දේ තමාගේ අනුදැනුම නොමැතිව බව හෝ ඒ වරද වැළැක්වීමට තමා සියලු උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව හෝ ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ විසින් නැතහොත් ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරු විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඔහු ඒ වරදට වරදකරු ලෙස නොසැලකිය යුතු ය.

(4) අධිකාරිය විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු හෝ සේවකයකු, මේ පනත යටතේ වූ වැරදි සම්බන්ධ නඩු කටයුතු පැවරීමේ කාර්යය සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136 වන වගන්තියේ අර්ථානුකූලව රජයේ නිලධරයන් ලෙස සැලකිය යුතු ය.

52. මේ පනත යටතේ වූ යම් වරදක් කිරීමට අදාළ අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන පාර්ශ්වකරුවන්ගේ කැමැත්ත ඇතිව අධිකාරිය විසින් ඒ වරද, ඒ සම්බන්ධයෙන් නියම කළ හැකි උපරිම දඩයෙන් තුනෙන් එකක් නොඉක්මවන මුදල් ප්‍රමාණයකට සමථයට පත් කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ වූ වරදක් සමථයට පත් කිරීම් වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන් අරමුදලට බැර කළ යුතු ය. වැරදි සමථයට පත් කිරීම.

නියෝග.

53. (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති කවර හෝ කාරණයක් සම්බන්ධ යෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයේ නිශ්චය කොට දැක්වෙන යම් පසු දින යක සිට හෝ ක්‍රියාත්මක වන්නේ ය.

(3) අමාත්‍යවරයා, විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සැලකෙන්නේ යම් දිනයක සිට ද ඒ දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

ඉවත් කිරීම සහ ආරක්ෂා කිරීම.

54. (1) 1971 අංක 13 දරන රාජ්‍ය මැණික් සංස්ථා පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ඉහත කී පනත ඉවත් කරනු ලැබුව ද—

(අ) නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේ දී රාජ්‍ය මැණික් සංස්ථාවේ බැරට ඇති සියලු මුදල්, මේ පනත යටතේ පිහිටුවනු ලබන අධිකාරියේ අරමුදලට නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, මාරු වන්නේ ය;

(ආ) නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේ දී රාජ්‍ය මැණික් සංස්ථාවට අයත් ව තිබුණා වූ සහ සංස්ථාවේ කාර්ය සඳහා ප්‍රයෝජනයට ගන්නා ලද සියලු චංචල හෝ නිශ්චල දේපළ, නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, අධිකාරිය වෙත සතු වන්නේ ය;

(ඇ) නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති, රාජ්‍ය මැණික් සංස්ථාවේ සියලු ණය හා බැරකම් නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි අධිකාරි යේ ණය හා බැරකම් ලෙස සැලකිය යුතු ය;

(ඈ) රාජ්‍ය මැණික් සංස්ථාවේ කාර්ය සඳහා ඇතිකර ගන්නා ලද සහ නියමිත දිනයට පෙරාතුවම වූ දින යේ දී පැවති සියලු ගිවිසුම් හා එකඟවීම්, අධිකාරිය විසින් ඇති කරගත් ගිවිසුම් හා එකඟවීම් ලෙස, නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි සැලකිය යුතු ය;

(ඉ) රාජ්‍ය මැණික් සංස්ථාව විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරනු ලැබ, නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේ දී අවසන් නොවී පවත්නා සියලු නඩු හා නඩු කටයුතු, අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව හෝ පවරන ලද නඩු සහ නඩු කටයුතු ලෙස, නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි සැලකිය යුතු ය ;

(ඊ) රාජ්‍ය මැණික් සංස්ථාවේ වාසියට හෝ ඊට විරුද්ධ ව හෝ යම් නිසි බලය ඇති අධිකරණයක් විසින් සටහන් කරනු ලැබ හෝ කරනු ලැබ නියමිත දින යට පෙරාතුවම වූ දිනයේ දී ඉටු නොවී පවත්නා සියලු තීන්දු ප්‍රකාශ සහ ආඥා අධිකාරියේ වාසියට හෝ ඊට විරුද්ධ ව හෝ සටහන් කරන ලද නැතහොත් කරන ලද තීන්දු ප්‍රකාශ හෝ ආඥා ලෙස, නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි සැලකිය යුතු අතර ඒවා ඒ අනුව ක්‍රියාත් මක කරනු ලැබිය හැකිය ;

(උ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී රාජ්‍ය මැණික් සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන්ව සිටි—

(i) අධිකාරියෙහි හෝ III වන කොටස යටතේ පිහිටු වන ලද ආයතනයක හෝ සේවා නියුක්තිය පිරිනමන ලදුව එය පිළිගත් නිලධරයන් සහ සේවකයන්, නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේදි ඔවුන්ට අදාළ වූ සේවා නියුක්තියේ නියමයන්ට හා කොන්දේසිවලට වඩා අඩු වාසිදායක නොවන නියමයන් හා කොන් දේසි මත එහි සේවයේ නියුක්ත කරනු ලැබිය යුතු ය ;

(ii) අධිකාරියෙහි හෝ III වන කොටස යටතේ පිහිටුවන ලද ආයතනයක හෝ සේවා නියුක්තිය පිරිනමනු නොලැබූ නැතහොත් ඒ අධිකාරියෙහි හෝ ආයතනයෙහි සේවා නියුක්තිය පිරිනමන ලදුව එසේ පිරිනමනු ලැබූ සේවා නියුක්තිය පිළිනොගත් නිල ධරයන්ට සහ සේවකයන්ට, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන වන්දි මුදලක් ගෙවනු ලැබීමට හිමිකම තිබිය යුතු ය ;

(ඌ) 1971 අංක 13 දරන රාජ්‍ය මැණික් සංස්ථා පනත යටතේ සාදන ලදුව නියමිත දිනයට පෙරාතුවම දිනයේ දි බලාත්මකව පැවතියා වූ ද මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ ද සෑම රීතියක්ම සහ සෑම අතුරු ව්‍යවස්ථාවක් ම මේ පනත යටතේ සදන ලද රීති හා අතුරු ව්‍යවස්ථා ලෙස සැලකිය යුතු ය ;

(එ) 1971 අංක 13 දරන රාජ්‍ය මැණික් සංස්ථා පනත යටතේ නිකුත් කරන ලද නැතහොත් නිකුත් කරන ලද සේ සැලකෙන සහ නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේ දී බලපවත්නා සියලු බලපත්‍ර මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍ර ලෙස සැලකිය යුතු ය.

අර්ථ නිරූපණය.

55. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස, මේ පනතෙහි—

"සභාපති" යන්නෙන්, 8 වන වගන්තිය යටතේ පත් කරන ලද අධිකාරියේ සභාපතිවරයා අදහස් වේ;

"අධ්‍යක්ෂ ජනරාල්" යන්නෙන්, 23 වන වගන්තිය යටතේ පත් කරන ලද අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"මුදල් මණ්ඩලය" යන්නෙන් මුදල් නීති පනතේ 8 වන වගන්තිය යටතේ සංස්ථාපනය කරන ලද, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ;

"මැණික් අපනයනය කිරීම" යන්නෙන්, විනිමය පාලකවරයා විසින් නියම කර ඇති සීමාවන්ට යටත්ව යම් තැනැත්තකු විසින් තම ශරීරයේ පැළඳගෙන හෝ ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙන් පිටතට රැගෙන යන හෝ ඉවතට ගෙන යන මැණික් හැර යම් මැණික්, ශ්‍රී ලංකාවෙන් පිටතට මුහුදින් හෝ ගුවනින් හෝ රැගෙන යාම සහ ඉවතට ගෙන යෑම හෝ රැගෙන යාමට සහ ඉවතට ගෙන යෑමට සැලැස්වීම අදහස් වේ;

"යම් ස්වර්ණාභරණ ආනයනය කිරීම" යන්නෙන්, විනිමය පාලකවරයා විසින් නියම කර ඇති සීමාවන්ට යටත්ව යම් තැනැත්තකු විසින් තම ශරීරයේ පැළඳගෙන හෝ ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාව තුළට ගෙන එන ස්වර්ණාභරණ හැර, යම් ස්වර්ණාභරණ, ශ්‍රී ලංකාව තුළට මුහුදින් හෝ ගුවනින් හෝ ආනයනය කිරීම හෝ ගෙන ඒම හෝ ආනයනය කිරීමට හෝ ගෙන ඒමට සැලැස්වීම අදහස් වේ;

"මැණික්" යන්නට යම් වටිනා ගලක් හෝ අර්ධ වටිනා ගලක් හෝ යම් මැණිකකින් හෝ එවැනි යම් ගලකින් කරන ලද නිෂ්පාදනයක් ඇතුළත් වේ;

"මැණික් කර්මාන්තය" යන්නෙන් මෙහි පනත දැක්වෙන සියලු පන්තිවලට අයත් හෝ විස්තර අදාළ වන නැතහොත් ඉන් යම් පන්තියකට අයත් හෝ විස්තරයක් අදාළ වන යම් කර්මාන්තයක් හෝ වෙළෙඳ ව්‍යාපාරයක් අදහස් වේ:—

(අ) මැණික් පතල් කැණීම හෝ මැණික් ගැරීම;

(ආ) ශ්‍රී ලංකාවට මැණික් ආනයනය කිරීම හෝ ශ්‍රී ලංකාවෙන් මැණික් අපනයනය කිරීම;

(ඇ) මැණික් විකිණීම, මිලට ගැනීම හෝ සැපයීම;

(ඈ) මැණික් තක්සේරු කිරීම;

(ඉ) මැණික් කැපීම, ඔප දැමීම, කැටයම් කැපීම හෝ මැණික්වලින් යමක් තෙලීම;

(ඊ) තාප පිරියම් කිරීම සහ මැණික්වල වටිනාකම නංවා ලීමේ වෙනත් ක්‍රම භාවිතය;

(උ) මැණික් පරීක්ෂා කොට සහතික කිරීම සහ වටිනා ලෝහ පිළිබඳ ලෝහ පරීක්ෂාව;

(ඌ) මැණික් කැපීම පුහුණු කිරීම;

"ස්වර්ණාභරණ" යන්නෙන් සිරුරේ පැළඳීම සඳහා වටිනා ලෝහවලින් හෝ වටිනා ගලින් තනන ලද යම් ආභරණයක් හෝ එවැනි ලෝහයෙන් හෝ වටිනා ගලින් තනන ලද කෞතුක භාණ්ඩයක් අදහස් වේ;

"ස්වර්ණාභරණ කර්මාන්තය" යන්නෙන් වටිනා ලෝහ පිළිබඳ ලෝහ පරීක්ෂාව හෝ වටිනා ලෝහවලින් නැතහොත් වටිනා ගලින් සිරුරේ පැළඳීම සඳහා වූ ආභරණ තැනීම හෝ ඒ ආභරණ අපනයනය කිරීම හා සම්බන්ධ යම් කර්මාන්තයක් හෝ වෙළෙඳ ව්‍යාපාරයක් අදහස් වේ;

"උපලේඛනගත ලිඛිත නීතිය" යන්නෙන් මේ පනතේ උපලේඛනයේ II වන කොටසේ නම් කාලීනව නිශ්චය කොට දැක්වෙන ලිඛිත නීතිවල විධිවිධාන අදහස් වේ;

"රාජ්‍ය මැණික් සංස්ථාව" යන්නෙන් 1971 අංක 13 දරන රාජ්‍ය මැණික් සංස්ථා පනත මගින් පිහිටුවන ලද රාජ්‍ය මැණික් සංස්ථාව අදහස් වේ.

56. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

(14 වන වගන්තිය)

## උපලේඛනය

### ලිඛිත නීතිවල විධිවිධාන

රජයේ ඉඩම් ආඥාපනතේ 2(6), 8, 17, 18, 20, 77(1), 78, 87, 88 සහ 89 යන වගන්ති.

පතල්, ඛනිජ ද්‍රව්‍ය හා ගල්වලවල් ආඥාපනතේ 2, 3, 7, 8, 9, 10, 11, 12, 15, 16, 17(2), 18, 19, 39, 41, 42 සහ 43 යන වගන්ති.